මාධ්‍ය නිවේදන අංක 04

**මැතිවරණ කොමිෂන් සභාව**

**මාධ්‍ය නිවේදනයයි.**

2022 පෙබරවාරි 23 වන දින පෙරවරු 10.00 ට මැතිවරණ මහලේකම් කාර්යාලයේ දී මැතිවරණ කොමිෂන් සභාව සහ පිළිගත් දේශපාලන පක්ෂවල ලේකම්වරුන් සමඟ පැවති රැස්වීමේ දී සාකච්ඡා කරන ලද කරුණු

**2022 - ඡන්දහිමි නාමලේඛන ප්‍රතිශෝධනය**

- 2022 - ඡන්දහිමි නාමලේඛන ප්‍රතිශෝධනය ආරම්භ කොට ඇති හෙයින් ඒ සඳහා දේශපාලන පක්ෂවල නියෝජිතයන්ගේ සහාය ලබාදීම අවශ්‍ය බව හා මෙතෙක් නියෝජිතයන් පත්කර නොමැති දේශපාලන පක්ෂ වෙතින් අදාළ නියෝජිතයින් පත් කරන ලෙස ඉල්ලා සිටීම

**පළාත් පාලන ඡන්ද විමසීම**

- පළාත් පාලන ආයතන විසිරවීම අවුරුද්දක් අඩු කිරීමට හෝ වැඩි කිරීමට බලය අදාළ පනත් ප්‍රකාරව අමාත්‍යවරයාට බලය පැවතුනද මෙම වසරේ සැප්තැම්බර් 20 දිනෙන් පසු පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් සම්බන්ධව කොමිෂන් සභාව වෙත බලයක් හිමිවන බැවින් ඒ අවස්ථාවේ සුදුසු තීරණයක් කොමිෂන් සභාව විසින් ගනු ලබන බව

**ඡන්ද විමසීම්වලදී දේශපාලන පක්ෂ විසින් ඉදිරිපත් කරනු ලබන ප්‍රතිපත්ති ප්‍රකාශ**

- දේශපාලන පක්ෂ විසින් ඡන්ද විමසීම් අවස්ථාවල දී ඉදිරිපත් කරනු ලබන ප්‍රතිපත්ති ප්‍රකාශ මැතිවරණයට පෙර කොමිෂන් සභාව වෙත ගෙන්වා ගැනීම හා එවා නීත්‍යානුකූල ලියවිල්ලක් බවට පත්කිරීමට අවශ්‍ය නීති සංශෝධනය කිරීමට කටයුතු කරනු ලබන ලෙස මැතිවරණ කොමිෂන් සභාව විසින් ඉල්ලීම් කර ඇති බව

මැතිවරණ කොමිෂන් සභාවේ නියමය පරිදි,

සමන් ශ්‍රී රත්නායක
මැතිවරණ කොමසාරිස් ජනරාල්

මැතිවරණ කොමිෂන් සභාව,
සරණ මාවත,
රාජගිරිය.
2022 පෙබරවාරි මස 24